# "දැව කර්මාන්තයේ නායකත්වය"

## රාජ්‍ය දැව සංස්ථාව
## පරිසර අමාත්‍යාංශය

# පුරප්පාඩු

රාජ්‍ය දැව සංස්ථාවේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) - (HM 1-2)

- **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය / ගිණුම්කරණය/ වාණිජ්‍ය / ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**සමඟ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් (Associate Membership) ලබා තිබීම

**සහ**

ප්‍රථම උපාධි සුදුසුකම ලබාගැනීමෙන් පසු සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක" කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15)ක පළපුරුද්දක් ලබා තිබීම

**හෝ**

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ , පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

**සහ**

ප්‍රථම උපාධි සුදුසුකම ලබාගැනීමෙන් පසු සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක" කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15)ක පළපුරුද්දක් ලබා තිබීම.

**"ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ"** තනතුරක අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම

- **වැටුප් පරිමාණය :** HM 1-2 – 2025 රු.(143,120/- - 4,100/- X15 = 204,620/=)
  (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/ 2025 හි II උපලේඛනය අනුව 2025.01.01 දින සිට)
- **වයස් සීමාව :** අවු. 35 සිට 55 දක්වා

## 2. සහකාර සාමාන්‍යාධිකාරී (කළමනාකරණ තොරතුරු පද්ධති) (HM 1-1)

- **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්ෂණ/ පරිගණක විද්‍යාව/ පරිගණක ජාලකරණය හෝ කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**සමඟ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ , පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් (Associate Membership) ලබා තිබීම.

**සහ**

ප්‍රථම උපාධි සුදුසුකම ලබාගැනීමෙන් පසු සංස්ථාවක, ව්‍යස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ " තනතුරක අවම වශයෙන් වසර දහතුනක (13) ක පළපුරුද්දක් ලබා තිබීම

**හෝ**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ , පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

**සහ**

සංස්ථාවක , ව්‍යස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක **"කළමනාකරණ මට්ටමේ"** තනතුරක අවම වශයෙන් වසර දහතුනක (13) ක පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

- **වැටුප් පරිමාණය :** HM 1-1 – 2025 රු.(140,640/- - 4,100/- X15 = 202,140/=)
  (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/ 2025 හි II උපලේඛනය අනුව 2025.01.01 දින සිට)
- **වයස් සීමාව :** අවු. 35 සිට 55 දක්වා

**වෙනත් ප්‍රතිලාභ**

- සේවකයන් සහ යැපෙන්නන් සඳහා වෛද්‍ය රක්ෂණාවරණ
- වාර්ෂික ප්‍රසාද දීමනා
- පැමිණීමේ දිරිදීමනා
- සංස්ථා ණය පහසුකම්
- සේ.අ.අ. සහ සේ.භා.අ. සඳහා දායකත්වය
- 1/2015 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රවාහන පහසුකම්

රාජ්‍ය දැව සංස්ථාව පිළිබඳ විස්තර, තනතුරුවලට අදාළ රාජකාරි, වගකීම් සහ සේවා කොන්දේසි සහ ආදර්ශ අයදුම්පත්‍රය වෙත පිවිසීමට පහත සපයා ඇති QR කේතය ස්කෑන් (Scan) කරන්න.

**අයදුම් කළයුතු ආකාරය**

අයදුම්කරුවන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව පමණක් සකස් කරන ලද අයදුම්පත සහ මූලික සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල සහතික කළ පිටපත් 2026 අගෝස්තු 28 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) , රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත එවනු ලබන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

**සැ.යු -** අපැහැදිලි, අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන හෝ මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ .

**සභාපති - රාජ්‍ය දැව සංස්ථාව**

tamilguru.lk